# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 39 දරන තේ පාලන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 ඔක්තෝබර් මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 නොවැම්බර් මස 08 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 39 දරන තේ පාලක (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1974 ඔක්තෝබර් මස 28 වන දින]**

**එල්. ඩී.—ඕ. 69/71**

**1957 අංක 51 දරන තේ පාලන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 39 දරන තේ පාලන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ප්‍රකෘෂ්ඨ නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1957 අංක 51 දරන තේ පාලන පනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ :— 1957 අංක 51 දරන පනතේ දීර්ඝ නාමය ප්‍රතිස්ථාපනය කිරීම.

"තේ වගාවන් සහ ඒවායේ අයිතිකරුවන් ලියාපදිංචි කිරීම සඳහා ද තේ නිෂ්පාදකයන් සහ ඔවුන් විසින් පවත්වා ගෙන යනු ලබන කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම සඳහා ද තේ වගාවන් සහ තේ කර්මාන්තශාලා වැඩිදියුණු කිරීම සහ ඒවා නඩත්තු කිරීම සඳහා ද පාලක විසින් නිකුත් කරනු ලබන නියමයන් අනුව ක්‍රියා නොකිරීමේ විපාක සම්බන්ධයෙන් ද තේ වගා කිරීම සහ නැවත වගා කිරීම, තේ යමකු සන්තකයේ තබා ගැනීම, විකිණීම හා මිලට ගැනීම යන දෑ පාලනය කිරීම සඳහා ද තේ, තේ ඇට සහ බෝ කිරීම සඳහා තේ පැළයෙන් ලබා ගත හැකි කොටස් පිටරට යැවීම පාලනය කිරීම සඳහා ද තේ පිටරට යැවීම සඳහා තීරු ගාස්තුවක් පැනවීම සඳහා ද තේ උපදේශක මණ්ඩලයක් පිහිටුවීම සහ මෙකී කරුණුවලට සම්බන්ධ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටසට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ IIඅ වන කොටස වශයෙන් බලපැවැත් වේ :— අලුත් කොටසක් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**'IIඅ වන කොටස**

**තේ වගාවන් හා තේ කර්මාන්තශාලා වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම සහ, පාලක විසින් නිකුත් කරනු ලබන නියමයන් අනුව ක්‍රියා නොකිරීමේ විපාක**

වතු, කුඩා වතු සහ කර්මාන්තශාලා වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම සම්බන්ධයෙන් ලියාපදිංචි කළ අයිතිකරුවන්ගේ සහ ලියාපදිංචි කළ නිෂ්පාදකයන්ගේ යුතුකම්.

11අ. සතුටුදායක යයි පාලක විසින් සලකනු ලබන (මෙහි මින් මතු "නියමිත තත්ත්වය" යනුවෙන් සඳහන් කරනු ලබන) නිෂ්පාදන හා පාලන තත්ත්වයට—

(අ) තම වත්ත හෝ කුඩා වත්ත වැඩිදියුණු කිරීම එවැනි වත්තක හෝ කුඩා වත්තක සෑම ලියාපදිංචි කළ අයිතිකරුවකුගේ ම යුතුකම වේ;

2—ඒ 09806—11,790 (74/09)

(ආ) තමා ලියාපදිංචි වී ඇත්තේ යම් තේ කර්මාන්තශාලාවක් සම්බන්ධයෙන් ද ඒ තේ කර්මාන්තශාලාව වැඩිදියුණු කිරීම එහි සෑම ලියාපදිංචි කළ නිෂ්පාදකයකුගේ ම යුතුකම වේ.

තවද නියමිත නිෂ්පාදන හා පාලන තත්ත්වය පවත්වා ගෙන යෑම ද වත්තක හෝ කුඩා වත්තක සෑම ලියාපදිංචි කළ අයිතිකරුවකුගේ ද තේ කර්මාන්තශාලාවක සෑම ලියාපදිංචි කළ නිෂ්පාදකයකුගේ ද යුතුකම වන්නේ ය.

වතු, කුඩා වතු සහ කර්මාන්තශාලා සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලා සිටීමට පාලකට ඇති බලය.

11ආ. යම් ලියාපදිංචි කළ වත්තක්, ලියාපදිංචි කළ කුඩා වත්තක් හෝ ලියාපදිංචි කළ කර්මාන්තශාලාවක් නියමිත තත්ත්වයට වැඩිදියුණු කර තිබේ ද යන්නත් නියමිත තත්ත්වයෙන් පවත්වා ගෙන යනු ලැබේ ද යන්නත් නිශ්චය කිරීමෙහි ලා ආධාර කර ගැනීම පිණිස, අවස්ථාවෝචිත පරිදි එම වත්ත, කුඩා වත්ත හෝ කර්මාන්තශාලාව සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු තම දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් කරනු ලබන කාලයක් ඇතුළත සපයන ලෙස හෝ ලේඛන ඉදිරිපත් කරන ලෙස හෝ ඉදිරිපත් කරවන ලෙස—

(අ) වත්තක් හෝ කුඩා වත්තක් සම්බන්ධයෙන් වූ විට එහි ලියාපදිංචි කළ අයිතිකරුට ද,

(ආ) කර්මාන්තශාලාවක් සම්බන්ධයෙන් වූ විට එහි ලියාපදිංචි කළ නිෂ්පාදකට ද

පාලක විසින් ලිඛිත දැන්වීමක් මගින් නියම කළ හැකි ය.

නියමිත තත්ත්වය නිශ්චය කිරීමේදී පාලක විසින් සැලකිල්ලට ගත යුතු කරුණු.

11ඇ. (1) ලියාපදිංචි කළ වත්තක් හෝ ලියාපදිංචි කළ කුඩා වත්තක් නියමිත නිෂ්පාදන හා පාලන තත්ත්වයට වැඩිදියුණු කර තිබේ ද යන්න හා එම තත්ත්වයෙන් නඩත්තු කර ගෙන යනු ලැබේ ද යන්න නිශ්චය කිරීමේ දී පාලක විසින් වෙනත් කරුණු අතර පහත සඳහන් කරුණු ගැන සැලකිලිමත් විය යුතු ය:—

(අ) නිපදවනු ලබන තේ ප්‍රමාණය සහ එම තේවල තත්ත්වය;

(ආ) වැඩි පලදාවක් ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් ලෙස පොහොර යෙදීම;

(ඇ) වැඩි පලදාවක් දෙන වර්ගවල අනුමත කළ ක්ලෝන යොදා යළි වගා කිරීම;

(ඈ) කාණු සහ හෙල්මළු ඉදි කිරීම, හිඟපාඩු පිරවීම, කෘමි වසංගත හා රෝග මර්දනය, වල් නෙලීම සහ සුළංවැටි සිටුවීම;

(ඉ) වත්ත හෝ කුඩා වත්ත මනා කෘෂිකාර්මික තත්ත්වයෙන් නඩත්තු කර ගෙන යාමට ගන්නා අතිකුත් පියවර ;

(ඊ) සේවකයන් සඳහා සුදුසු නිවාස පහසුකම් සැපයීම, හා එම නිවාස සුදුසු තත්ත්වයෙන් නඩත්තු කර ගෙන යාමට අවශ්‍ය අලුත්වැඩියාවන් කිරීම ;

(උ) අවශ්‍ය ස්ථානවල පාරවල් තැනීම හා ඒවා සුදුසු තත්ත්වයෙන් නඩත්තු කර ගෙන යාම ; සහ

(ඌ) තේ වගාවට නුසුදුසු බිම් පෙදෙස්වල වෙනත් අනුමත කළ බෝග වර්ග වගා කිරීම.

(2) ලියාපදිංචි කළ තේ කර්මාන්තශාලාවක් නියමිත නිෂ්පාදන හා පාලන තත්ත්වයට වැඩි දියුණු කර තිබේ ද යන්නත් එම තත්ත්වයෙන් නඩත්තු කර ගෙන යනු ලැබේ ද යන්නත් නිශ්චය කිරීමේ දී පාලක විසින් වෙනත් කරුණු අතර පහත සඳහන් කරුණු ගැන සැලකිලිමත් විය යුතු ය :—

(අ) කර්මාන්තශාලා ගොඩනැගිල්ලේ තත්ත්වය සහ එය මනා තත්ත්වයෙන් නඩත්තු කර ගෙන යාමට අවශ්‍ය අලුත්වැඩියා කිරීම ;

(ආ) හොඳ තත්ත්වයේ සෑදූ තේ නිෂ්පාදනය කිරීමට අවශ්‍ය දියුණු කාර්මික ක්‍රමවලට අනුකූල යන්ත්‍ර සූත්‍ර හා අතිකුත් උපකරණ සැපයීම සහ ඒ යන්ත්‍ර සූත්‍ර හා අතිකුත් උපකරණ සුදුසු තත්ත්වයෙන් නඩත්තු කර ගෙන යාමට අවශ්‍ය අලුත්වැඩියාවන් කිරීම ;

(ඇ) යම් ලියාපදිංචි කළ වත්තකට හෝ ලියාපදිංචි කළ කුඩා වත්තකට හෝ අයිති ලියාපදිංචි කළ තේ කර්මාන්තශාලාවක් සම්බන්ධයෙන් වූ විට, එම වත්තේ හෝ කුඩා වත්තේ අමු තේ නිෂ්පාදනයේ වැඩිවීමට තරම් වන පරිදිත් සෑදූ තේ නිෂ්පාදනය සඳහා වෙනත් වතුවලින් හෝ වෙනත් කුඩා වතුවලින් අමු තේ ගැනීමක් කෙරෙතොත් එහි වැඩිවීමක් වේ නම් ඊට ද තරම් වන පරිදිත් නිෂ්පාදන ශක්තිය වැඩි කිරීම ;

(ඈ) යම් ලියාපදිංචි කළ වත්තකට හෝ ලියාපදිංචි කළ කුඩා වත්තකට අයිති නැති ලියාපදිංචි කළ තේ කර්මාන්ත ශාලාවක් සම්බන්ධයෙන් වූ විට, සෑදූ තේ නිෂ්පාදනය සඳහා අමු තේ කොළ ගැනීමෙහි ලා ඇති වන යම් වැඩිවීමකට තරම් වන පරිදි නිෂ්පාදන ශක්තිය වැඩි කිරීම.

නඩත්තු කිරීමට සහ වැඩිදියුණු කිරීමට අදාළ ප්‍රමිත පිළිබඳ උපදේශක කමිටුව.

11ඈ. පාලකගෙන් සහ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තවත් සාමාජිකයන් සිව් දෙනකුගෙන් සමන්විත වූ විශේෂ උපදේශක කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය. තේ පාලක එහි සභාපතිවරයා වන්නේ ය. ලියාපදිංචි කළ වත්තක් හෝ ලියාපදිංචි කළ කුඩා වත්තක් හෝ ලියාපදිංචි කළ කර්මාන්තශාලාවක් නියමිත නිෂ්පාදන හා පාලන තත්ත්වයට වැඩිදියුණු කර ඇති බවට නැතහොත් එකී තත්ත්වයෙන් නඩත්තු කරගෙන යනු ලබන බවට පාලක සෑහීමට පත් නොවන අවස්ථාවක දී නියමිත නිෂ්පාදන හා පාලන තත්ත්වයට ඒ වත්ත හෝ කුඩා වත්ත හෝ කර්මාන්තශාලාව වැඩිදියුණු කිරීමත් ඒ තත්ත්වයෙන් නඩත්තු කිරීමත් නිසැකයෙන් ම කරනු ලැබීමට ගත යුතු ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන් උපදේශක කමිටුවේ උපදෙස් ලබා ගැනීම සඳහා එම කරුණ පාලක විසින් උපදේශක කමිටුව වෙත යොමු කළ යුතු ය.

නියමයන් නිකුත් කිරීමට පාලකට ඇති බලය සහ අමාත්‍යවරයා වෙත කරනු ලබන අභියාචනා.

11ඉ. (1) යම් ලියාපදිංචි කළ වත්තක් හෝ ලියාපදිංචි කළ කුඩා වත්තක් හෝ ලියාපදිංචි කළ කර්මාන්තශාලාවක් නියමිත නිෂ්පාදන හා පාලන තත්ත්වයට වැඩිදියුණු කර නැති බව හෝ ඒ තත්ත්වයෙන් නඩත්තු කර ගෙන නොයන බව පාලකගේ මතය වන අවස්ථාවක, පාලක විසින් උපදේශක කමිටුවේ උපදෙස් ලබා ගැනීමෙන් පසු, අවස්ථාවෝචිත පරිදි, එම වත්තේ හෝ කුඩා වත්තේ ලියාපදිංචි කළ අයිතිකරු වෙත හෝ කර්මාන්තශාලාවේ ලියාපදිංචි කළ නිෂ්පාදක වෙත යවනු ලබන ලිඛිත නියමයක් මගින් එම වත්ත, කුඩා වත්ත හෝ කර්මාන්ත ශාලාව නියමිත නිෂ්පාදන හා පාලන තත්ත්වයට වැඩිදියුණු කිරීමට හෝ එම තත්ත්වයෙන් නඩත්තු කර ගෙන යාමට අවශ්‍ය යයි පාලක විසින් සලකනු ලබන්නා වූ ද ඔහුගේ නියමයෙහි නිශ්චිත ව සඳහන් කරනු ලබන්නා වූ ද,—

(අ) වැඩිදියුණු කිරීම් කරන ලෙස හෝ නියමයන් ඉටු කරන ලෙස නියම කිරීම; හෝ

(ආ) සීමා හෝ තහනම් නියම කිරීම

පාලක විසින් කළ හැකි ය.

(2) අභියාචනා කළ හැකි කාල පරිච්ඡේදය තුළ දී (3) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත අභියාචනයක් කරන ලද්දේ නම් මිස, (1) වන උපවගන්තිය යටතේ පාලක විසින් කරනු ලැබූ සෑම නියමයක් ම, එම නියමයෙහි නිශ්චිත ව සඳහන් කරනු ලබන දින තිහකට නොඅඩු විය යුතු කාලයක් තුළ දී අවස්ථාවෝචිත පරිදි, ලියාපදිංචි කළ අයිතිකරු විසින් හෝ ලියාපදිංචි කළ නිෂ්පාදක විසින් පිළිපැදිය යුතු ය.

(3) පාලක විසින් කරන ලද නියමය තමාට දැනුම් දෙනු ලැබූ දිනයේ සිට දින තිහක් ඇතුළත දී යම් ලියාපදිංචි කළ අයිතිකරුවකු හෝ ලියාපදිංචි කළ නිෂ්පාදකයකු විසින් ඒ නියමයට විරුද්ධ ව අමාත්‍යවරයා වෙත අභියාචනය කළ හැකි අතර එවිට අමාත්‍යවරයා විසින් ඒ නියමය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

(4) අමාත්‍යවරයා විසින්, යම් අභියාචනයක් පිළිබඳ සිය තීරණය කිරීමට පෙර, එම අභියාචනය ඉදිරිපත් කළ තැනැත්තාට තමා විසින් ම හෝ නියෝජිතයකු මඟින් අමාත්‍යවරයා ඉදිරියේ කරුණු කියා සිටීමට අවස්ථාව ලබා දිය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ වූ යම් අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක වන අතර කිසිදු අධිකරණයක දී එය විවාදයට භාජන නොකළ යුතු ය.

(6) පාලක විසින් කරන ලද යම් නියමයක් අභියාචනයේ දී අමාත්‍යවරයා විසින් ස්ථිර කරනු ලබන හෝ වෙනස් කරනු ලබන අවස්ථාවක ඒ නියමය හෝ වෙනස් කරන ලද පරිදි වූ නියමය අනුව යම් දිනයකට පෙර ක්‍රියා කළ යුතු වේ ද ඒ දිනය අමාත්‍යවරයා විසින් නිශ්චිත ව සඳහන් කළ යුතු අතර එසේ නියම කරනු ලබන කාල සීමාව ඇතුළත ඒ නියමය අනුව ක්‍රියා කිරීම ලියාපදිංචි කළ අයිතිකරුගේ හෝ ලියාපදිංචි කළ නිෂ්පාදකගේ යුතුකම වන්නේ ය.

අනුමත කළ භෝග වගා කිරීම.

11ඊ. ලියාපදිංචි කළ යම් වත්තක් හෝ කුඩා වත්තක් නියමිත නිෂ්පාදන හා පාලන තත්ත්වයට වැඩිදියුණු කිරීම හෝ ඒ තත්ත්වයෙන් නඩත්තු කර ගෙන යෑම ඒ වත්තේ හෝ කුඩා වත්තේ ලියාපදිංචි කළ අයිතිකරුට හසුරුවා ගත නොහැකි හේතු නිසා කළ නොහැකි බවට පාලක සෑහීමට පත් වන අවස්ථාවක, ඒ වත්තේ හෝ කුඩා වත්තේ අයිතිකරු විසින් ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කරනු ලැබූ විට, පාලක විසින් අනුමත කරනු ලබන යම් භෝග වර්ගයක් ඒ වත්තේ හෝ කුඩා වත්තේ වගා කිරීමට පාලක විසින් ඔහුට බලය දිය හැකි ය.

ලියාපදිංචි කළ වතු, ලියාපදිංචි කළ කර්මාන්තශාලා සහ ලියාපදිංචි කළ කුඩා වතු අත්කර ගැනීම.

11උ. (1) පාලක විසින් 11ඉ වන වගන්තිය යටතේ යම් ලියාපදිංචි කළ වත්තක් හෝ ලියාපදිංචි කළ කර්මාන්තශාලාවක් සම්බන්ධයෙන් කරන ලද නියමයක් හෝ, තමා විසින් වෙනස් කරන ලද පරිදි වූ එම නියමය—

(අ) ඒ වත්ත හෝ කර්මාන්තශාලාව සම්බන්ධයෙන් සතුටුදායක ලෙස පිළිපැදීම, අවස්ථෝචිත පරිදි, එහි ලියාපදිංචි කළ අයිතිකරු විසින් හෝ ලියාපදිංචි කළ නිෂ්පාදක විසින් පැහැර හැර ඇති බව, නැතහොත්

පාලක විසින් 11ඉ වන වගන්තිය යටතේ යම් ලියාපදිංචි කළ කුඩා වත්තක් සම්බන්ධයෙන් කරන ලද නියමයන් හෝ, තමා විසින් වෙනස් කරන ලද පරිදි වූ එම නියමයන්—

(ආ) ඒ කුඩා වත්ත සම්බන්ධයෙන් සතුටුදායක ලෙස පිළිපැදීම එහි ලියාපදිංචි කළ අයිතිකරු විසින් නැවත නැවතත් පැහැර හැර ඇති බව

අමාත්‍යවරයාගේ මතය වන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන (මෙහි මින් මතු "සතු කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් දිනයක සිට, ඒ ලියාපදිංචි කළ වත්ත, ලියාපදිංචි කළ කර්මාන්තශාලාව හෝ ලියාපදිංචි කළ කුඩා වත්ත ආණ්ඩුව සතු කරනු ලැබිය හැකි ය.

(2) සතු කිරීමේ නියමයක නිශ්චිත ව සඳහන් යම් ලියාපදිංචි කළ වත්තක්, ලියාපදිංචි කළ කුඩා වත්තක් හෝ ලියාපදිංචි කළ කර්මාන්තශාලාවක් පිළිබඳ පරම අයිතිය ඒ නියමයෙහි නිශ්චිත ව සඳහන් දින සිට සියලු බැඳීම්වලින් තොරව ආණ්ඩුව වෙත හිමි කිරීම ඒ නියමයෙහි බලපෑම වන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සතු කිරීමේ නියමයක් යම් ලියාපදිංචි කළ වත්තක්, ලියාපදිංචි කළ කුඩා වත්තක් හෝ ලියාපදිංචි කළ කර්මාන්තශාලාවක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද ද ඒ ලියාපදිංචි කළ වත්ත, ලියාපදිංචි කළ කුඩා වත්ත හෝ ලියාපදිංචි කළ කර්මාන්තශාලාව මින් පසු මේ කොටසේ "ලියාපදිංචි දේපල" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

සතු කිරීමේ නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම.

11ඌ. (1) යම් ලියාපදිංචි දේපලක් සතු කිරීමේ නියමයක් ප්‍රකාර ආණ්ඩුව සතු වී තිබුණ ද ඒ නොතකා, ඒ ලියාපදිංචි දේපල වෙනුවෙන් මේ පනත යටතේ වන්දි ගෙවීම පිළිබඳ තීරණයක් කිරීමට පෙර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තදනන්තර නියමයක් මගින් අමාත්‍යවරයා විසින් එම සතු කිරීමේ නියමය ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

(2) යම් ලියාපදිංචි දේපලක් සම්බන්ධයෙන් වූ සතු කිරීමේ නියමයක් (1) වන උපවගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ අවස්ථාවක එම සතු කිරීමේ නියමය අදාළ වන ලියාපදිංචි දේපල එම සතු කිරීමේ නියමය ප්‍රකාර කිසි විටෙකත් ආණ්ඩුව සතු වී නොතිබුණු ලෙස සැලකිය යුතු අතර එම ලියාපදිංචි දේපල පිළිබඳ යම් අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් පිළිබඳ ව පැන නැඟිය හැකි යම් ප්‍රශ්නයක් ඒ අනුව නිශ්චය කළ යුතු ය.

(3) මේ පනතේ අන් කිසි විධිවිධානයක හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇත ද ඒ නොතකා මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන බලපවත්වන්නේ ය.

ලියාපදිංචි දේපලක සන්තකය භාර ගැනීම.

11ඒ. (1) ආණ්ඩුව සතු කරන ලද යම් ලියාපදිංචි දේපලක සන්තකය භාර ගැනීම සඳහා පාලක විසින් විශේෂයෙන් හෝ පොදුවේ බලය පවරනු ලැබූ (මෙහි මින් මතු "බලය ලත් නිලධරයා" යනු වෙන් සඳහන් කරනු ලබන) යම් නිලධරයකු විසින් ඒ දේපලෙහි සන්තකය භාර ගත හැකි ය.

(2) ආණ්ඩුව සතු කරන ලද යම් දේපලක ලියාපදිංචි අයිතිකරු වෙත හෝ ලියාපදිංචි නිෂ්පාදක වෙත සහ එම දේපල පරිහරණය කරන තැනැත්තා වෙත යම් බලය ලත් නිලධරයකු විසින්, භාර දෙනු ලැබූ හෝ එම ලියාපදිංචි දේපලෙහි හෝ ඒ අසල පැහැදිලි ව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරන්නා වූ දැන්වීමක් මගින්—

(අ) එම දැන්වීමේ නිශ්චිත ව සඳහන් දිනයේ දී, වේලාවේ දී සහ ස්ථානයේ දී ආණ්ඩුව සඳහා හා වෙනුවෙන් එකී බලය ලත් නිලධරයා එම ලියාපදිංචි දේපලේ සන්තකය භාර ගැනීමට අදහස් කරන බව ඒ තැනැත්තන්ට දැනුම් දිය යුතු ය; තවද

(ආ) ඒ දේපලට සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකුට හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයාට එසේ නිශ්චිත ව සඳහන් කරනු ලැබූ දිනයේ දී, වේලාවේ දී හා ස්ථානයේ දී පැමිණ සිටින ලෙස හා එකී බලය ලත් නිලධරයාට ආණ්ඩුව සඳහා හා වෙනුවෙන් එම ලියාපදිංචි දේපලේ සන්තකය භාර ගැනීමට ඉඩ දෙන ලෙස හා සහාය වන ලෙස නියම කළ යුතු ය.

(3) යම් තැනැත්තකු වෙත කළ යුතු යයි මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන යටතේ නියමිත යම් දැන්වීමක් ලියාපදිංචි කළ ලිපියකින් තැපැල් මාර්ගයෙන් ඔහු වෙත යවන ලද නම් ඒ දැන්වීම ඔහු වෙත කරන ලද ලෙස සලකනු ලැබේ.

(4) මේ වගන්තිය යටතේ තමා වෙත කරන ලද දැන්වීමක යම් නියමයක් කඩ කරන යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

ආණ්ඩුව සඳහා හා වෙනුවෙන් යම් ලියාපදිංචි දේපලක සන්තකය භාර ගැනීම වැළැක්වීම හෝ ඊට බාධා කිරීම.

11ඔ. (1) ලියාපදිංචි යම් දේපලක සන්තකය ආණ්ඩුව සඳහා හා වෙනුවෙන් 11ඒ (1) වන වගන්තිය යටතේ භාර ගැනීමෙන් හෝ භාර ගැනීමෙහි ලා යම් බලය ලත් නිලධරයකු—

(අ) වළක්වාලන හෝ ඔහුට බාධා කරන හෝ විරුද්ධකම් පාන, හෝ

(ආ) කෙළින් ම හෝ අන් ආකාරයකින් යම් කෙනකු ලවා වළක්වාලන හෝ ඒ නිලධරයාට බාධා කිරීමට හෝ විරුද්ධකම් පෑමට සලස්වන

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

(2) යම් ලියාපදිංචි දේපලක සන්තකය ආණ්ඩුව සඳහා හා වෙනුවෙන් භාර ගැනීමේ බලය බලය ලත් නිලධරයකු වෙත පවරා ඇති විටක, කර ඇති හෝ කිරීමට ඉඩ ඇති යම් බාධාවක් හෝ විරුද්ධකම් පෑමක් නිසා ඒ ලියාපදිංචි දේපලෙහි සන්තකය භාර ගැනීමට ඒ නිලධරයා අපොහොසත්ව සිටින හෝ තමා එහි ලා අපොහොසත් විය හැකි යැයි ඔහුට සිතෙන අවස්ථාවක, ඒ ලියාපදිංචි දේපල හෝ දේපලෙහි කොටස පිහිටි ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඔහු විසින් ඒ සඳහා ඉල්ලීමක් කළ විට ආණ්ඩුව සඳහා හා වෙනුවෙන් ඒ ලියාපදිංචි දේපලෙහි සන්තකය තමාට භාර දෙන ලෙස පිස්කල්ට නියම කරන ආඥාවක් ඒ අධිකරණයෙන් ලබා ගැනීමට ඔහුට හිමිකම තිබේ.

(3) මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් (2) වන උපවගන්තිය යටතේ ආඥාවක් පිස්කල් වෙත නිකුත් කරනු ලැබූ අවස්ථාවක ඔහු විසින් ඒ ආඥාව නොපමාව ක්‍රියාත්මක කළ යුතු අතර ඒ ආඥාව ක්‍රියාත්මක කළ ආකාරය ලියවිල්ලකින් ඒ අධිකරණයට වාර්තා කළ යුතු ය.

(4) මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් (2) වන උපවගන්තිය යටතේ ආඥාවක් පිස්කල් වෙත නිකුත් කරනු ලැබූ අවස්ථාවක ඒ ආඥාව සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමේ, එය වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ අදහසින් යම් අධිකරණයක ගෙන ඇති හෝ ආරම්භ කිරීමට අදහස් කර ඇති යම් පියවරක් හේතුකොට ගෙන ඒ ආඥාව ක්‍රියාත්මක කිරීම කිසිම ලෙසකින් නතර නොකළ යුතු ය.

(5) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා පිස්කල් විසින් හෝ ඔහුගේ මෙහෙයවීම යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින්, එම ආඥාව අදාළ වන ලියාපදිංචි දේපලට ඇතුළු වීමට හා එය පරිහරණය කරන යම් තැනැත්තකු ඉන් නෙරපීමට ද ඒ ලියාපදිංචි දේපලේ සන්තකය ආණ්ඩුව සඳහා හා වෙනුවෙන් භාර ගැනීමට බලය ලත් තැනැත්තාට එහි සන්තකය භාර දීමට ද අවශ්‍ය විය හැකි යම් බලයක් පාවිච්චි කළ හැකි ය.

ආණ්ඩුව සතු කරන ලද ලියාපදිංචි දේපල සම්බන්ධයෙන් වන්දි.

11ඞ. යම් දිනයක ආණ්ඩුව සතු කරන ලද යම් දේපලක් වෙනුවෙන් මේ පනත යටතේ ගෙවිය යුතු වන්දි මුදල වූකලී ප්‍රධාන තක්සේරුකරුගේ මතය අනුව ඒ දිනයේ දී එම ලියාපදිංචි දේපලෙහි සාධාරණ වටිනාකමට සමාන මුදල වේ.

වන්දි මුදලට පොලී.

11ක. මේ පනත යටතේ කළ හැකි යම් අඩුකර ගැනීම් කපා ගැනීමෙන් පසු ගෙවිය යුතු වන යම් වන්දි මුදලක් සඳහා, ඒ වන්දිය අයත් වී ගෙවිය යුතු වන දින සිට එය ගෙවනු ලබන දිනය තෙක් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමාණයක් අනුව වූ පොලියක් ගෙවනු ලැබිය යුතු ය.

වන්දි අයත් වීම ආරම්භ වනුයේ කෙදිනක සිට ද යන බව.

11ග. යම් ලියාපදිංචි දේපලක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය එම ලියාපදිංචි දේපල ආණ්ඩුව සතු කරන ලද දිනයේ සිට අයත් වන ලෙස සැලකිය යුතු ය.

වන්දි ගෙවීමේ ආකාරය හා ක්‍රමය.

11ජ. වන්දි ගෙවීමේ ආකාරය හා ක්‍රමය මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කළ යුතු ය.

වන්දි නිශ්චය කිරීම.

11ට. (1) ආණ්ඩුව සතු කරන ලද යම් ලියාපදිංචි දේපලක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය නිශ්චය කිරීම, පාලක විසින් ප්‍රධාන තක්සේරුකරු වෙත යොමු කළ යුතු අතර, ඒ තක්සේරුකරු විසින් තම නිශ්චය පාලක වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) ආණ්ඩුව සතු කරන ලද යම් ලියාපදිංචි දේපලක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි ප්‍රමාණය පිළිබඳ තම නිශ්චය කිරීමට පෙර, ඒ ලියාපදිංචි දේපල සතු කර ගන්නා ලද්දේ යම්

තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තාට මෙන් ම පාලකට ද, තමා විසින් ම හෝ ඒ සඳහා තමා විසින් බලය පවරනු ලබන නියෝජිතයකු මගින් ඒ ලියාපදිංචි දේපලෙහි වටිනාකම පිළිබඳ සාක්ෂි ප්‍රධාන තක්සේරුකරු ඉදිරියේ දැක්වීමට අවස්ථාවක්, ප්‍රධාන තක්සේරුකරු විසින් ලබා දිය යුතු ය.

(3) ලියාපදිංචි දේපලක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය වශයෙන් ප්‍රධාන තක්සේරුකරු විසින් කරන ලද නිශ්චය කිරීම එම ලියාපදිංචි දේපල සතු කර ගන්නා ලද්දේ යම් තැනැත් තකුගෙන් ද ඒ තැනැත්තා වෙත පාලක විසින් ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

(4) යම් ලියාපදිංචි දේපලක් සඳහා ගෙවීමට පාලක අදහස් කරන්නා වූ ද ප්‍රධාන තක්සේරු කරු විසින් නිශ්චය කරනු ලැබූ වන්දිය වන්නා වූ ද වන්දි මුදල නිශ්චිත ව සඳහන් කරමින් ද, එම ලියාපදිංචි දේපල රජය සතු කිරීමට පෙරාතුව ම එම ලියාපදිංචි දේපල පිළිබඳ යම් සම්බන්ධ තාවක් දැරූ හා ඒ ලියාපදිංචි දේපල සම්බන්ධ යෙන් යම් වන්දියකට හිමිකම් කියාපාන්නා වූ යම් තැනැත්තකුගේ හිමිකම් පෑමක් ඇත් නම් දැන්වීමෙහි නිශ්චිත ව සඳහන් දිනයට පෙර ඒ හිමිකම් පෑමෙහි ස්වභාවය සහ එයට පදනම් වූ කරුණු දක්වමින්, ලියවිල්ලකින් පාලක වෙත ඒ හිමිකම් පෑම ඉදිරිපත් කරන ලෙස දන්වමින් ද, පාලක විසින් ගැසට් පත්‍රයේ හා යටත් පිරිසෙයින් එක් සිංහල, එක් දෙමළ හා එක් ඉංග්‍රීසි පුවත් පතක දැන්වීමක් පළ කරවිය යුතු ය.

වන්දි ගෙවීම.

11ඩ. (1) 11ට වන වගන්තිය යටතේ වූ දැන්වීමකට පිළිතුරු වශයෙන් යම් ලියාපදිංචි දේපලක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන වන් දිය සඳහා, ඒ ලියාපදිංචි දේපල සතු කර ගන්නා ලද්දේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා නොවන වෙනත් තැනැත්තකු විසින් හිමිකම් පෑමක් ඉදිරිපත් නොකරන ලද අවස්ථාවක, ඒ වන්දි මුදලින් අඩුකර ගැනීමට මේ පනතින් හා මේ පනත යටතේ නියමිත යම් මුදලක් අඩුකර

ගැනීමෙන් පසු ඒ වන්දි මුදල, ඒ ලියාපදිංචි දේපල සතු කර ගන්නා ලද්දේ යම් තැනැත්තකු ගෙන් ද ඒ තැනැත්තාට ගෙවීමට පාලක විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) යම් ලියාපදිංචි දේපලක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන වන්දිය සඳහා 11ට වන වගන්තිය යටතේ වූ දැන්වීමකට පිළිතුරු වශයෙන්, ඒ ලියාපදිංචි දේපල සතු කර ගන්නා ලද්දේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා නොවන වෙන යම් තැනැත්තකුගෙන් යම් හිමිකම් පෑමක් ලැබුණා වූ අවස්ථාවක, ඒ සෑම හිමිකම් පාන්නකු විසින් සහ ඒ ලියාපදිංචි දේපල සතු කර ගන්නා ලද්දේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තා ද විසින් වන්දි ලැබීමට හිමිකම් ඇති තැනැත්තන් කවුරුන් ද යන්න ගැනත් වන්දි මුදල කොටස් කර බෙදා ගත යුතු ආකාරය ගැනත් ලියවිල්ලකින් සමාදානයෙන් එකඟත්වයට පත් වූවහොත්, පාලක විසින්, මේ පනතින් හෝ එය යටතේ අඩුකර ගැනීමට නියමිත යම් මුදලක් ඒ වන්දියෙන් අඩුකර ගෙන, ඒ එකඟවීමට අනුව, ඒ තැනැත්තන් අතර ඒ වන්දි මුදල කොටස් කර බෙදා ඔවුන්ට ගෙවීමට සැලැස්විය යුතු ය. එවැනි එකඟවීමක් ඇති නොවී නම්, මේ පනතින් හෝ එය යටතේ අඩුකර ගැනීමට නියමිත යම් මුදලක් ඒ වන්දියෙන් අඩුකර ගෙන, හිමිකම් ඇති තැනැත්තන් විසින් ලබා ගනු පිණිස, ගෙවීමට ඇති මුදලේ ප්‍රමාණය රුපියල් එක් දහස් පන්සියයට වැඩිවීම හෝ අඩුවීම හෝ අනුව යම් දිසා අධිකරණයකට හෝ මහෙස්ත්‍රාත් අධිකරණයකට ඒ වන්දි මුදල ගෙවීමට පාලක විසින් කටයුතු සැලැස්විය යුතු ය.

වන්දිය නොපිළිගන්නා අවස්ථා ආදිය සම්බන්ධයෙන් විධිවිධාන.

11ණ. මේ පනත යටතේ යම් තැනැත්තකුට ගෙවිය යුතු යම් වන්දි මුදලක් ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබූ කල්හි ඔහු එය නොපිළිගන්නා ලද අවස්ථාවක හෝ ඒ තැනැත්තා මියගොස් ඇති හෝ අහව්‍ය හෝ ඔහු ගැන තොරතුරක් දැනගන්නට නොමැති හෝ අවස්ථාවක, ඊට හිමිකම් ඇති තැනැත්තා හෝ තැනැත්තන් විසින් ලබා ගනු පිණිස, ඒ වන්දි මුදලේ ප්‍රමාණය රුපියල් එක් දහස් පන්සියයට වැඩිවීම හෝ අඩුවීම හෝ අනුව ඒ වන්දි මුදල යම් දිසා අධිකරණයකට හෝ මහෙස්ත්‍රාත් අධිකරණයකට ගෙවිය යුතු ය.

වන්දියෙන් අඩු කිරීම.

11ත. (1) ආණ්ඩුව සතු කරන ලද යම් ලියාපදිංචි දේපලක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට වන්දියක් හිමි වූ අවස්ථාවක දී, පාලක විසින්,—

(අ) එම වන්දි මුදලින්—

(i) ඒ තැනැත්තාගේ ආදායම හෝ ලාභ වෙනුවෙන් ගෙවිය යුතු බද්ද වශයෙන් හෝ පෞද්ගලික බද්ද වශයෙන් ඒ තැනැත්තාගෙන් අය විය යුතු යයි දේශීය ආදායම් කොමසාරිස්ගේ අත්සන යටතේ පාලක වෙත සහතික කරනු ලැබූ යම් මුදලක් දේශීය ආදායම් කොමසාරිස්ට ගෙවිය යුතු ය;

(ii) ඒ තැනැත්තා විසින්, සතු කිරීමේ ඇණවුම ප්‍රසිද්ධ කළ දිනයෙන් පසු එම ලියාපදිංචි දේපලේ සේවය අවසාන කරනු ලැබූ හෝ එම දිනයෙන් පසුවත් එහි තවදුරටත් සේවයෙහි නිරතව සිටින්නා වූ අන් කිසි තැනැත්තකුට හිඟ වැටුප්, අර්ථසාධක අරමුදලේ දායක මුදල්, පාරිතෝෂික හෝ වෙනත් මුදල් ප්‍රතිලාභයක් වශයෙන් ගෙවිය යුතු ලෙස කම්කරු කොමසාරිස්ගේ අත්සන යටතේ පාලක වෙත සහතික කරනු ලැබූ යම් මුදලක් කම්කරු කොමසාරිස්ට ගෙවිය යුතු ය.

(ආ) 1958 අංක 12 දරන තේ සහනාධාර පනත යටතේ හා එම පනත යටතේ සාදන ලද නියෝග යටතේ ඒ තැනැත්තාගෙන් පාලකට අය විය යුතු යම් මුදලක් අඩු කර ගත යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යයන් සඳහා "වන්දිය" යන යෙදුමට, එම වන්දි මුදල වෙනුවෙන් එකතුව අය විය යුතුව ඇති යම් පොලියක් ද ඇතුළත් වේ.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"මේ පනත යටතේ වූ විධාන, නියම සහ තහනම් කිරීම් හෝ සීමා කිරීම් පිළි නොපැදීම.

39. මේ පනත යටතේ දෙන ලද, කරන ලද හෝ පනවන ලද යම් විධානයක්, නියමයක්, තහනමක් හෝ සීමා කිරීමක් පිළිපැදීම පැහැර හරින සෑම තැනැත්තෙක් ම වරදක් කරන්නේ ය.".